# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2014 අංක 2 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2014 පෙබරවාරි මස 21 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 පෙබරවාරි මස 21 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 3.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

**2014 අංක 2 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2014 පෙබරවාරි මස 21 වැනි දින]

එල්.ඩී. — ඕ. 36/2012.

**ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2014 අංක 2 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 23 දරන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතන පනතේ 6 වන වගන්තියේ (1) උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් ඡේද ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 23 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) පහත නම් සඳහන් නිලබලයෙන් පත්වන සාමාජිකයන් —

(i) 16 වන වගන්තිය යටතේ පත් කරන ලද ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ii) ශ්‍රී ලංකා වානිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ සභාපතිවරයා හෝ උප සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් නම් කරනු ලබන යම් සාමාජිකයකු;

(iii) ශ්‍රී ලංකා ජාතික වානිජ මණ්ඩලයේ සභාපතිවරයා හෝ උප සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් නම් කරනු ලබන යම් සාමාජිකයකු;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා;

2- PL 007863 — 2,800 (2013/11)

(v) කාර්මික, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(vi) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන එම බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(vii) මුදල් සහ සැලසුම් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධරයකු; සහ

(viii) 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා හෝ එම ප්‍රධාන විධායක නිලධරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධරයකු;

(ආ) පහත දැක්වෙන පරිදි අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙක්, එනම් —

(i) ව්‍යාපාර කළමනාකාරිත්වය පිළිබඳ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් ඇත්තා වූ ද, ඉහළ මට්ටමේ කළමනාකාර ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයක් ලබා ඇත්තා වූ ද, තැනැත්තන් වන සාමාජිකයන් දෙදෙනෙකු; සහ

(ii) කාර්මික සම්බන්ධතා සහ වෘත්තීය සමිති ක්‍රියාකාරකම් පිළිබඳ අවම වශයෙන් වසර දහයක පළපුරුද්දක් ඇති තැනැත්තකු වන එක් සාමාජිකයකු.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය .

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.